// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1818/7 - 2013 ජූලි මස 09 වැනි අඟහරුවාදා - 2013.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(ix).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද, සමාගම් අංක පීවී 17745 දරන්නා වූ කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (CINEC) සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ I වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති උපාධි වැඩසටහන් පිරිනැමීමට සහ ඊට අනුරූපව මෙහි උපලේඛනයේ II වැනි තීරයෙහි සඳහන් උපාධි කෙටි නාම ලබාදීම සඳහා කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (CINEC) උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමි.

**උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධි පාඨමාලාවන්* | *II වැනි තීරය*<br>*උපාධි පාඨමාලාවන් සඳහා කෙටි නාම* |
|---|---|
| නාවික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | BSc (Hons) Maritime Science |
| නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | BSc (Hons) Marine Engineering |
| කාර්ය සම්පාදන හා ප්‍රවාහන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | BSc (Hons) Logistics & Transportation |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

07 - 719

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 001676 — 810 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*